බන්ධ : කො : චක්‍ර ලේඛ : අංක : 16/2010

බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

2010-04-08

මූලස්ථාන මාණ්ඩලික නිලධාරීන් සහ
සියලුම අධිකාරි/සහකාර අධිකාරි වරුන් වෙත

## බන්ධනාගාර මූලස්ථාන රැස්වීම් ශාලාව

නවීකරන කරන ලද බන්ධගාර මූලස්ථාන රැස්වීම් ශාලාවට අළුතින් ගන්නා ලද ගෘහ භාණ්ඩ, විදුලි හා විද්‍යුත් උපකරණ සියල්ල මූලස්ථාන ගබඩාකරු විසින් ලේඛණ ගත කර විෂය භාර මාණ්ඩලික නිලධාරියා වෙත යොමු කල යුතුය.

මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීම සඳහා මෙම ශාලාව පරිහරණය කිරීමට වන අවස්ථාවන් වල අදාල නිලධාරියා විසින් බන්ධනාගාර මූලස්ථාන අධිකාරි භාරයේ ඇති අදාල ලේඛණය මගින් ඒ සඳහා ඉල්ලුම් කර පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව පාවිච්චිය සඳහා ලබා නොදිය යුතුය.

මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීම් පැවැත්වීම සඳහා වෙන්කර ඇති මෙම ශාලාව වෙනත් කිසිදු රැස්වීම් හෝ අමතර කටයුතු සඳහා නොයෙදවිය යුතුය.

මෙම රැස්වීම් ශාලාව පරිහරණය නොකරන අවස්ථාවල පවිත්‍රව තැබීමටත්, විදුලිය හා වායුසමීකරණ යන්ත්‍ර ක්‍රියා විරහිත කර දොර අගුලු ලා තැබීමට එම ශාලාව භාර නිලධාරියා විසින් කටයුතු කල යුතු අතර ශාලාවට අයත් ගෘහ භාණ්ඩ විදුලි හා විද්‍යුත් උපකරණ ඇතුළු සියළු උපාංග වල සුරක්ෂිතතාවය පිළිබඳ වග බලා ගත යුතුය.

වී.ආර්. සිල්වා ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ අයිජී
මේජර් ජනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්